සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. ඊජියන් මුහුද | 2. ලිස්බන් | 3. සිසිලි |
| 4. ප්ලෝරන්ස් | 5. රයින් ගංගාව | 6. කොන්ස්තන්තිනෝපල් |
| 7. බෝල්ටික් මුහුද | 8. නෙදර්ලන්තය | 9. ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය |
| 10. ස්පාඤ්ඤය | 11. මැන්චෙස්ටර් | 12. ස්වීඩනය |

(නිවැරදිව නම් කිරීමට හා ලකුණු කිරීමට ලකුණු 1 බැගිනි) (ල.12)

02. පහත දැක්වෙන ක්ෂේත්‍ර ඇසුරින් ඉස්ලාම් ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ පරික්ෂා කරන්න.
(i) බල ව්‍යාප්තිය (ii) ආර්ථිකය (iii) කලාව සහ ගෘහ නිර්මාණය (ල.16)

03. (i) ග්‍රීක පොර රාජ්‍යවල දේශපාලන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල. 7)
(ii) අධ්‍යාපනය සහ දර්ශනය යන ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීක කාර්යය සාඵල්‍යය පරීක්ෂා කරන්න. (ල. 9)

04. (i) බටහිර යුරෝපයේ වැඩවසම් ක්‍රමය නැගී ඒමට තුඩු දුන් සාධක සැකෙවින් පරීක්ෂා කරන්න. (ල. 7)
(ii) වැඩවසම් ක්‍රමයේ පරිහානියට බලපෑ සාධක පරීක්ෂා කරන්න. (ල. 9)

05. ''ජාතික රාජ්‍යයන්ගේ නැගීම යුරෝපයේ දේශපාලනය නූතන යුගයට හැඩ ගැස්වූ සන්ධිස්ථානය විය''
(i) ජාතික රාජ්‍ය බිහිවීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. (ල. 2)
(ii) ජාතික රාජ්‍යවල පොදු ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල. 6)
(iii) ඉහත ප්‍රකාශය සැළකිල්ලට ගනිමින් එංගලන්තය ජාතික රජ්‍යයක් වූ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 8)

06. (i) දේශ ගවේෂණ ව්‍යාපාරය යුරෝපා බල ව්‍යාප්තියේ කේන්ද්‍රිය ව්‍යාපාරය විය. (ල. 1)
(ii) දේශ ගවේෂණ ව්‍යාපාරයට අනුග්‍රහය දැක් වූ ජාතික රාජ්‍ය පාලකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)
(iii) දේශ ගවේෂණ ව්‍යාපාරයට බලපෑ හේතු සැකෙවින් පරීක්ෂා කරන්න. (ල. 4)
(iv) දේශ ගවේෂණ ව්‍යාපාරයට යුරෝපයේ ජාතික රාජ්‍ය අවතීර්ණ වූ ආකාරය පැහැදිලි කරමින් ඉන් උද්ගත වූ ප්‍රතිඵල විග්‍රහ කරන්න. (ල. 8)

07. (i) ආගමික ප්‍රතිසංස්කරණ සඳහා බලපෑ හේතු පරීක්ෂා කරන්න. (ල. 8)

(ii) යුරෝපයේ දේශපාලනය කෙරෙහි ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය බලපෑ ආකාරය විමසන්න. (ල. 8)

08. ''තිස් අවුරුදු යුද්ධය ආගමික හේතු පදනම් කර ගනිමින් ආරම්භ වුව ද එහි ව්‍යාප්තිය යුරෝපා පාලකයින්ගේ දේශපාලන අරමුණු ඉටු කළේය.''

(i) තිස් අවුරුදු යුද්ධය ආරම්භ වීමට මූලික වූ රට නම් කරන්න. (ල. 1)

(ii) තිස් අවුරුදු යුද්ධය ආරම්භ වීමට හේතු වූ ප්‍රධාන ආගමික පාර්ශව දෙක නම් කරන්න. (ල. 2)

(iii) තිස් අවුරුදු යුද්ධයට බලපෑ හේතු සැකෙවින් පරීක්ෂා කරන්න. (ල. 5)

(iv) ඉහත ප්‍රකාශය සැළකිල්ලට ගනිමින් තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. (ල. 8)

09. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) පුරාණ රෝම පාලන ක්‍රමය

(ii) පුනරුද සමයේ කලාව සහ සාහිත්‍ය ප්‍රබෝධය

(iii) කාදිනල් රිචලියුගේ කාර්යභාරය

(iv) බ්‍රිතාන්‍යයේ දේශපාලන පක්ෂ ක්‍රමය (එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)